## පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරය

AAT/111 /2020 (NPC)

ඩබ්.එම්.ගයනි දීපිකා කුමාරි,
**අභියාචක**
**එදිරිව**
ජාතික පොලිස් කොමිෂන් සභාව
**වගඋත්තරකරු**

**දිනය :-2026.02.17**

ඉදිරියේ දී :- විනිසුරු කේ.ටී.චිත්‍රසිරි (සභාපති)
ජේ.ජේ.රත්නසිරි (සාමාජික)
එස්.නන්දසේකරන් (සාමාජික)

පෙනී සිටීම :- අභියාචක වෙනුවෙන් රජයේ සේවක ඩී.ආර්.ඩී.යූ.දිසානායක මහතා.
වගඋත්තරකාර ජාතික පොලිස් කොමිෂන් සභාව වෙනුවෙන් නීති උපදේශක ටී.කේ.ආර්.පී.ජයතුංග මිය සමඟ නියෝජ්‍ය අධ්‍යක්ෂක ආර්.එම්.එස්.පී.රත්නායක මහතා.

**-<u>නියෝගය</u>-**

## විනිසුරු කේ.ටී.චිත්‍රසිරි මැතිතුමා

ඩබ්.එම්.ගයනි දීපිකා කුමාරි යන අය විසින්, 2020.06.25 වෙනි දින මෙම විනිශ්චය අධිකාරය වෙත ඉදිරිපත් කරන ලද අභියාචනා පෙත්සම මඟින් ඉල්ලා ඇත්තේ, ඇය වෙත නිකුත් කර ඇති විනය නියෝගය සහ ඒ අනුව නිකුත් කරන ලද ජාතික පොලිස් කොමිෂන් සභාවේ තීරණය, නිශ්ප්‍රභ කරමින්, විලම්භනය කරන ලද වැටුප් වර්ධක දෙක නැවත ගෙවීමට කටයුතු සළසා දෙන ලෙසය. අභියාචක වෙත නිකුත් කර ඇති විනය නියෝගය, 2018.03.16 දිනැතිව ඌව පළාත භාර ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිවරයා විසින් නිකුත් කරන ලද ලිපියේ සඳහන්ව ඇත. එකී විනය නියෝගය අනුව අභියාචක වෙත ඉදිරිපත් කර තිබූ චෝදනා 05 අතුරින් ප්‍රථම චෝදනා 04ට අභියාචක වරදකරු කර ඇත. එසේ වරදකරු කරමින් ඇයගේ වැටුප් වර්ධක දෙකක් විලම්භනය කිරීමට නියෝග කර ඇත. එකී නියෝගයට එරෙහිව අභියාචක විසින් ජාතික පොලිස්

කොමිෂන් සභාව වෙත අභියාචනයක් ඉදිරිපත් කර ඇත. ජාතික පොලිස් කොමිෂන් සභාව විසින්, 2020.05.28 දිනැතිව නිකුත් කරන ලද ලිපිය මඟින් ඉහත කී අභියාචනය ප්‍රතික්ෂේප කර ඇත. අභියාචක විසින් ඉල්ලා ඇත්තේ ජාතික පොලිස් කොමිෂන් සභාවේ එකී තීරණය හා ඇය වෙත නිකුත් කර ඇති විනය නියෝගය ඉවත් කර දෙන ලෙසයි.

ඉහතින් සඳහන් විනය නියෝගය නිකුත් කර ඇත්තේ, අභියාචක වෙත ඉදිරිපත් කරන ලද අපකීර්තිදායක ලෙස හැසිරීම, අණට අකීකරුව හෝ පීඩාකාරී ලෙස හැසිරීම, රාජකාරිය පැහැර හැරීම, හා බොරු කීම හෝ ඇත්ත සඟවා කතා කිරීම යන චෝදනා 05න්, පළමු චෝදනා හතරට අභියාචක වරදකරු බවට පත්කර තිබූ හෙයිනි. එම චෝදනා සම්බන්ධයෙන් විධිමත් විනය පරීක්ෂණයක් පවත්වා ඇත. විධිමත් විනය පරීක්ෂණය පැවැත්වූ නිලධාරියා විසින් ඔහුගේ 2017.12.20 දිනැති වාර්තාව, ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිවරයා වෙත ඉදිරිපත් කර ඇත. එම වාර්තාවට අනුව විධිමත් විනය පරීක්ෂණය පැවැත්වූ නිලධාරියා විසින් අභියාචකට එරෙහිව ඉදිරිපත් කර තිබූ 1, 3, 4, 5 යන චෝදනා ඔප්පු වී නොමැති බවට නිගමනය කර ඇත. එකී විනය පරීක්ෂණ නිලධාරියාගේ වාර්තාව සළකා බැලීමෙන් පසුව, ඌව පළාත භාර ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිවරයා විසින් එකී පරීක්ෂණ නිලධාරියාගේ නිගමනය පිළිගෙන නොමැති අතර, ඔහු තීරණය කර ඇත්තේ, ඉදිරිපත් කර තිබූ 05 වන චෝදනා හැර, අනෙක් සියලු චෝදනාවන්ට අභියාචක වරදකරු බවයි.

විනය බලධාරියා විසින් විධිමත් පරීක්ෂණයක් පැවැත්වූ නිලධාරියකුගේ නිගමනයන්ට එරෙහිව කිසියම් තීරණයකට එළඹෙන්නේ නම්, ඒ සඳහා වන හේතු විනය බලධාරියා විසින් පැහැදිලිව දක්විය යුතු බව ආයතන සංග්‍රහයේ, දෙවන වෙළුමේ, XLVIII පරිච්ඡේදයේ 22:7 වගන්තියෙහි සඳහන් වේ. ඒ අනුව විනය බලධාරියා විසින්, එසේ වෙනත් නියෝගයක් කිරීමට හේතු එකී විනය බලධාරියා විසින් අදාළ ගොනුවේ සටහන් කර තිබිය යුතුය.

එම අවශ්‍යතාවය මෙම අවස්ථාවේ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිවරයා විසින් සම්පූර්ණ කර තිබේද යන්න පරීක්ෂා කර බලන ලදී. ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිවරයා විසින් නිකුත් කරන ලද 2019.03.16 දිනැති විනය නියෝගයේ 06 වන ඡේදයේ සිට 09 වන ඡේදය දක්වා ඇති ඡේදයන්හි, මෙම සිද්ධිය සම්බන්ධයෙන් විශ්ලේෂණයක් ඉදිරිපත් කරමින්, ඔහුගේ තීරණයට එළඹීමට හේතුවූ කරුණු එහි පැහැදිලිව සඳහන් කර ඇත. ඔහුගේ එකී හේතුන් විනය නියෝගයේ 08 වන ඡේදයේ වැඩිදුරටත් සඳහන් කර ඇත. ඒ අනුව ඉහත කී

ආයතන සංග්‍රහයේ II වෙළුමේ XLVIII වන පරිච්ඡේදයේ 22:7 වන වගන්තිය යටතේ වන අවශ්‍යතාවය මෙහිදී සම්පූර්ණ කර ඇති බව පැහැදිලිව පෙනී යයි.

මෙම තත්ත්වය යටතේ විමසා බැලිය යුතු වන්නේ, ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිවරයා විසින් අභියාචක චෝදනා හතරකට වැරදිකරු බවට පත්කර තිබීම නිවැරදි ද යන කරුණයි. අභියාචක වෙත ඉදිරිපත් කර තිබූ චෝදනා සියල්ලටම පදනම් වී ඇත්තේ මරියදාස් ක්‍රිෂාන්ති පැට්‍රිෂියා යන බාල වයස්කාර දැරිය විසින් ඇයව දූෂණය කිරීමක් සම්බන්ධයෙන් කරන ලද පැමිණිල්ලක්, සටහන් කර නොගැනීම සහ එකී දැරියට පොලිස් ස්ථානයේ දි පහරදීමක් සිදුකර තිබුණාය යන කරුණුයි.

සිද්ධිය වන අවස්ථාව වන විට ඉහතකී මරියදාස් ක්‍රිෂාන්ති පැට්‍රිෂියා නැමැති අය අවුරුදු 14ක් වයසැති බාලවයස්කාර දැරියක් බව පිළිගත් කරුණකි. ඇය විසින් මූලික විමර්ශනයේ දි ලබා දී ඇති සාක්ෂිය, විධිමත් විනය පරීක්ෂණයේ දී ඇයගේ මූලික සාක්ෂිය ලෙසට පිළිගෙන ඇත. එහිදී ඇය සඳහන් කර ඇත්තේ, තුෂාර නැමැති අයෙක් ඇයව කිසියම් නිවසකට රැගෙන ගොස් දූෂණය කළ බවයි. එම සිද්ධිය අංක 119 යටතේ දුරකථන පනිවිඩයක් මගින් දැනුම් දුන් බවට සාක්ෂි ඉදිරිපත් ව ඇත. එම පණිවිඩය අනුව ක්‍රියාත්මක වූ පොලීසිය ක්‍රිෂාන්ති පැට්‍රිෂියා යන අයට පොලිසියට පැමිණෙන ලෙසට ඇයගේ නිවසට ගොස් දැනුම් දී ඇත. ඉන් අනතුරුව ක්‍රිෂාන්ති පැට්‍රිෂියා යන අය, ඇයගේ දෙමාපියන් සමඟ 2016.07.07 දින සවස පොලිස් ස්ථානයට පැමිණ ඇත. එම අවස්ථාවේ දී මෙම සිද්ධිය පොලිස් ස්ථානාධිපතිවරයා වෙත සහ අභියාචක පොලිස් නිලධාරිනිය වෙත දැනුම් දී ඇත. එම කරුණද අවිවාදයෙන් තොරව පිළිගෙන ඇත.

එසේ පැමිණිල්ලක් කිරීම සඳහා පැමිණි දැරියගේ පැමිණිල්ල සටහන් කර නොගෙන තිබීම යන කරුණ මෙහිදී ඔප්පු කළ යුතු වැදගත් කරුණක් වනවා ඇත. එදින එනම් 2016.07.07 දින, එම පැමිණිල්ල සටහන් කර නොගත් බව ද අවිවාදයෙන් තොරව පිළිගෙන ඇත. එම පැමිණිල්ල සටහන් කරගෙන ඇත්තේ, ඊට පසු දින වන, 2016.07.08 වන දින දීය. එදින එනම්, 2016.07.08 වන දින අභියාචක විසින් පැමිණිලිකාරියගේ ප්‍රකාශය සටහන් කරගෙන ඇත.

2016.07.07 දින මෙම දැරියගේ ප්‍රකාශය සටහන් කර නොගැනීම සම්බන්ධයෙන් අභියාචක විසින් ඉදිරිපත් කර ඇති කරුණු කෙරෙහි අවධානය යොමු කරන ලදි. පැමිණිල්ල වෙනුවෙන් ඉදිරිපත් කරන ලද සාක්ෂි අවසන් කිරීමෙන් අනතුරුව අභියාචක වෙනුවෙන් පෙනී සිටි රැකවරණ නිලධාරියා පවසා ඇත්තේ, අභියාචක විසින් 2016.08.13 දින ලබා දි ඇති ප්‍රකාශය වි.1

ලෙසට සළකුණු කරමින්, ඒ අනුව සාක්ෂි මෙහෙයවීමට අවසර ඉල්ලා සිටින බවත් ය. ඒ අනුව අභියාචක සාක්ෂි දෙමින් මෙසේ පවසා ඇත.

> "**මා කියා සිටින්නේ 2016.07.07 දින ක්‍රිෂාන්ති පැට්‍රිෂියා දැරිය ස්ත්‍රී දූෂණයක් සම්බන්ධ පැමිණිල්ලක් කිරීමට කටයුතු නොකළ බවයි. එසේ පැමිණිල්ලක් කිරීමට අවශ්‍ය බව දැන්වූයේ නම් අනිවාර්යෙන් මා එම පැමිණිල්ල සටහන් කරන බව දන්වා සිටිමි.**"

යනුවෙනි.

මෙහිදී සඳහන් කළ යුතු වන්නේ පැමිණිල්ල මෙහෙයවූ නිලධාරියා මෙම සාක්ෂිකාරියගෙන් කිසිදු හරස් ප්‍රශ්නයක් ඇසීමට උත්සාහයක්වත් ගෙන නොමැතිව තිබීමයි. පැමිණිල්ල මෙහෙයවමින් කටයුතු කර ඇති එම නිලධාරියාගේ ක්‍රියා කලාපය සම්පූර්ණයෙන්ම වැරදි සහගතය.

කෙසේ වෙතත් අභියාචක විසින් ලබා දී ඇති ඉහත සාක්ෂිය අනුව පෙනී යන්නේ, ක්‍රිෂාන්ති පැට්‍රිෂියා නැමැති දැරිය විසින් පැමිණිල්ලක් කිරීමට අවශ්‍ය බව නොදැන්වීම නිසා ඇය එය සටහන් කර නොගත් බවයි. නමුත් එම අවස්ථාව වන විට මෙම වරදේ බරපතල ස්වභාවය, අභියාචක විසින් තේරුම් ගෙන සිට ඇත. වින්දිතයා පොලිස් ස්ථානය වෙත පැමිණෙන්නේ සිදුවූ අපරාධය පිළිබඳව ඊට පෙර දින 119 දුරකථනයට කරන ලද දැනුම් දීමකින් අනතුරුවය. එසේ නම් බාලවයස්කාරියක දූෂණයට ලක්වීම පිළිබඳව පොලීසියට කරන ලද ප්‍රථම දැනුම්දීම වන්නේ එකී දුරකථන පණිවිඩයයි. එවැනි තත්ත්වයක් යටතේ අභියාචක විසින් වින්දිත දැරියගේ ප්‍රකාශයක් සටහන් කිරීම, වින්දිත දැරියගේ අවශ්‍යතාවය මත ප්‍රතික්ෂේප කිරීම වැරදි සහගතය. මෙහිදී වරදේ බරපතලකම උප පොලිස් පරීක්ෂකවරයෙකු ලෙස ඇය විශේෂයෙන්ම අවබෝධ කරගෙන තිබිය යුතුය. මෙම අපරාධය සම්බන්ධයෙන් චෝදනා ලැබ සිටි පුද්ගලයා එම චෝදනාවට අධිකරණයෙන් වරදකරු බවටද පත්වී ඇත. එවැනි තත්ත්වයක් යටතේ පැමිණිල්ල සටහන් කර ගැනීමේ දී, පැමිණිලිකාරියගේ අභිමතයට ඉඩදෙමින් පැමිණිල්ල සටහන් කර නොගැනීම සම්පූර්ණයෙන්ම වැරදි සහගතය.

මෙම තත්ත්වය යටතේ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිවරයා විසින් විනය පරීක්ෂණ නිලධාරියාගේ තීරණයට පටහැනිව කටයුතු කරමින්, අභියාචක වරදකරු බවට පත්කර තිබීම ඉතාමත් නිවැරදිය. ඉහත හේතූන් අනුව පෙනී යන්නේ අභියාචක වෙත ඉදිරිපත් කර තිබූ 1, 3, 4 සහ 5 චෝදනා වලට අභියාචක වරදකරු කිරීමේ දෝෂයක් පෙනෙන්නට නොමැති බවයි.

දෙවෙනි චෝදනාවෙහි සඳහන් වන්නේ අභියාචක විසින් ක්‍රිෂාන්ති පැට්‍රිෂියා යන අයට තරවටු කිරීමක් හෝ පහර දීමක් සිදු කළාය යන්නයි.

ක්‍රිෂාන්ති පැට්‍රිෂියා නැමති අයගේ සාක්ෂිය අනුව ඇය ප්‍රකාශ කොට ඇත්තේ, අභියාචක ලොකු පොල්ලකින් ඇයට පහරදුන් බවයි. අභියාචකගේ පියා ප්‍රකාශ කර ඇත්තේ පොඩි පොල්ලක් අත තබාගෙන, දුවගෙන් ප්‍රශ්න කරමින් පොලිස් කාන්තාවක් සිටි බවයි. වින්දිත දැරියගේ මව සාක්ෂි දෙමින් ප්‍රකාශ කර ඇත්තේ ලී කෝටුවකින් දුවගේ ඉන පැත්තට එකපාරක් ගැසූ බවයි. ඒ අනුව සාක්ෂිකරුවන් තිදෙනෙකුම, මෙම අභියාචක විසින් වින්දිත දැරිය වන ක්‍රිෂාන්ති පැට්‍රිෂියා යන අයට පහර දුන් බව සනාථ කිරීම සඳහා සාක්ෂි ඉදිරිපත් කර ඇත. අභියාචක මෙම තත්ත්වය ප්‍රතික්ෂේප කලත්, ඉහත කී සාක්ෂි ඒ හේතුවෙන්ම බැහැර කළ නොහැක.

ඉහත හේතූන් සළකා බලා අභියාචකට එරෙහිව ඉදිරිපත් කර ඇති චෝදනා හතරටම ඇය වරදකරු කිරීමේ දෝෂයක් පෙනෙන්නට නොමැත. එම කරුණු සළකා බලා ඉදිරිපත් කර ඇති අභියාචනය නිශ්ප්‍රභ කිරීමට තීරණය කරමු.

අභියාචනය නිශ්ප්‍රභ කරමු.

විනිසුරු කේ.ටී.චිත්‍රසිරි
(සභාපති)

මම එකඟ වෙමි

(ජේ.ජේ.රත්නසිරි)
(සාමාජික)

මම එකඟ වෙමි

(එස්.නන්දසේකරන්)
(සාමාජික)

ලලිතා/-